# ලක්දිව බුද්ධ ප්‍රතිමාවල චීවර නිරූපණය පිළිබඳ අධ්‍යයනයක්

වරාපිටියේ මංගල හිමි[1]

බුද්ධකාලයේ අනෙකුත් ශ්‍රමණ සම්ප්‍රදායයන් විසින් භාවිත වස්ත්‍ර සුදුසුදැයි ඇතැම් භික්ෂූන් වහන්සේලා අත්හදා බැලීම් කළ අවස්ථා මහාවග්ග පාළි චීවරක්ඛන්ධකයේ දක්නට ඇත. බුදුපියාණෝ නොයෙක් ආකාරයෙන් අල්පේච්ඡ වූවහුගේ, ලද දෙයින් සතුටුවූවහුගේ, කෙලෙස් ලියාදමන පැවතුම් ඇත්තහුගේ, කෙලෙස් සලන පැවතුම් ඇත්තහුගේ, පහදවන සුලු පැවතුම් ඇත්තහුගේ, කෙලෙස් නසන පැවතුම් ඇත්තහුගේ, වීර්ය ඇත්තහුගේ ගුණ කියන සේක. මෙම ගුණයන්ට ගැලපෙන, අනුලෝමික වූයේ යැයි තමන්ට සිතෙන වස්ත්‍ර කිහිපයක් ඇඳගෙන පැමිණි ඔවුහු ඒවා සියලු බුද්ධශ්‍රාවකයන් වහන්සේලාට අනුදන වදාරණ ලෙස තථාගතයන් වහන්සේගෙන් ඉල්ලූහ. මහාවග්ග පාළියේ දැක්වෙන පරිදි තථාගතයන් වහන්සේ එසේ යෝජනා වූ වස්ත්‍ර දහයක් ප්‍රතික්ෂේප කළ සේක.

බුදුපියාණන් වහන්සේ විසින් ප්‍රතික්ෂේප කළ එම වස්ත්‍ර දහය නම්

1. කුසචීරං - කුසවැහැරි (කුස තණවලින් සාදා ගත් සිවුර)
2. වාකචීරං - වා වැහැරි, රුක් පොතුවලින් කළ සිවුරු
3. ඵලකචීරං - පෝරු වැහැරි, පුවරු සටහනින් (සියුම් ලී පතුරින්) කළ වැහැරි
4. කෙසකම්බලං - කෙහෙ කම්බිලි (මිනිස් කෙස්වලින් කළ කම්බිලි)
5. වාලකම්බලං - සැඩ මුව ලොමින් (අස් සෙමරින්) කළ කම්බිලි
6. උලූකපක්ඛං - බකමූණු පියාපතින් කළ වස්ත්‍ර
7. අජිනක්ඛිපං - අඳුන් දිවි සම්
8. අක්කනාළං - වරා හුයෙන් කළ වස්ත්‍ර
9. පොත්ථකං - නියඳ වැහැරියෙන් කළ වස්ත්‍ර
10. තිරීටකං - රුක් පොතු මුවා පිළි (ගස් පොතු, සුඹුළුවලින් සාදාගන්නා වස්ත්‍ර)

වාකචීර යනු ගස්වල පොතු තලා සකසා වියන ලද වස්ත්‍රයි. ගසක පට්ටය ගෙන තලා වේලා කෙඳි සකසා වියාගන්නා වැහැරි සිවුරක් වන මෙය බෙහෙවින් වන ගත වූ රුක්ෂ පිළිවෙත් ඇති තවුසන් විසින් භාවිත කර ඇත. ඇතැම් තැනෙක 'ඵලකචීරං' යන්න 'ඒලකචීර' යනුවෙන් ද යෙදී ඇත. මෙම ලයිස්තුවේ මුල් සිවුරු හතින් එකක් හෝ දැරීමෙන් ථුල්ලච්චය ආපත්තියක් වන බවත් අන්තිමට දැක්වෙන වස්ත්‍ර වර්ග තුන සිවුරු ලෙස දැරීමෙන් දුක්කටාපත්තියක් වන බවත් මහාවග්ග පාළියේ දැක්වේ.

---

[1] ආචාර්ය, ගංගොඩවිල සුභද්‍රාරාම පිරිවෙන් විද්‍යායතනය. mwarapitiya@yahoo.com

6. අකරණීයං - (ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයන්ට) නොකටයුත්තකි.
7. තිත්ථියධජං - (ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයන්ට නොගැලපෙන) තීර්ථක ධ්වජයකි.
8. අප්පසන්නානං පසාදාය - නොපැහැදුනවුන්ගේ පැහැදීම පිණිස හේතු නොවේ.
9. පසන්නානං භීයොභාවාය-පැහැදුනවුන්ගේ වැඩිපැහැදීම පිණිස හේතු නොවේ.

ඉහතින් දැක්වූ වස්ත්‍ර අතුරින් මුලින් දැක්වූ වස්ත්‍ර හත අනෙකුත් ශ්‍රමණ සම්ප්‍රදායයන් විසින් භාවිත 'ධ්වජ' (අනන්‍යතාවයන්) ලෙස හඳුන්වා ඇත. මනුෂ්‍ය කෙස්වලින් කරන ලද අතිශයින් පිළිකුල් වූ කෙහෙ කම්බිලියේ ඇති දෝෂ හයක් සුමංගලවිලාසිනියේ දැක්වේ.

1. සීත කාලයේ සීතල වේ. (සීතකාලෙ සීතො)
2. උෂ්ණ කාලයේ උණුසුම වේ. (උණ්හකාලෙ උණ්හො)
3. අල්ප වටිනාකමක් ඇත්තකි. (අප්පග්ඝො)
4. දුක්ඛදායක ස්පර්ශ ඇත්තකි. (දුක්ඛසම්ඵස්සො)
5. දුර්වර්ණ වූවකි. (දුබ්බණ්ණො)
6. දුගඳ හමන්නකි. (දුග්ගන්ධො)

මේ දෝෂයන්ගෙන් තොර වූ චීවර වස්ත්‍ර බුදුපියාණන් වහන්සේ විසින් අනුදත්හ. එනමුත් එම චීවරයන්හි වර්ණය අනුව ද නුසුදුසු යැයි බැහැර කළ චීවර කිහිපයකි.

1. සියල්ල නිල් පාට වූ චීවර (සබ්බනීලකානි චීවරානි)
2. සියල්ල රන්වන් (කහපාට) වූ චීවර (සබ්බපීතකානි චීවරානි)
3. සියල්ල රතුපාට වූ චීවර (සබ්බලොහිතකානි චීවරානි)
4. සියල්ල මදටිය පාට වූ චීවර (සබ්බමඤ්ජෙට්ඨිකානි චීවරානි)
5. සියල්ල කළුපාට වූ චීවර (සබ්බකණ්හානි චීවරානි)
6. සියල්ල රත්වැපිට පාට වූ චීවර (සබ්බමහාරංගරත්තානි චීවරානි)
7. සියල්ල මුසුපැහැති වූ චීවර (සබ්බමහානාමරත්තානි චීවරානි)

'මහාරංගරත්තානි' යනු පත්තෑයන්ගේ පිටේ පැහැය මෙන් රතට හුරු දුඹුරුවන් පාට වූ වස්ත්‍රයි. 'මහානාමරත්තානි' යනු ඉදුණු කොළවල පැහැය ඇති වස්ත්‍රයි. මෙම වස්ත්‍ර ලැබුනහොත් පඩු පොවා පාට වෙනස් කරගත යුතුවේ. එසේ නොමැති නම් එම වස්ත්‍ර ඇඳ ඇතිරිලි ආදියට භාවිත කළ හැකිය. නිල් කහ ආදී තනි වර්ණයන්ගෙන් යුතු සිවුරු ප්‍රතික්ෂේප කර ඇති බැවින් තථාගතයන් වහන්සේ අනුදැන ඇත්තේ මිශ්‍රවර්ණ සිවුරු බව පැහැදිලි වේ.

චීවරය සකස් කරන ලද ආකාරය, ආකෘතිය අනුව ද නුසුදුසුයැයි ප්‍රතික්ෂේප කළ චීවර කිහිපයකි.

1. නොසිඳි දාවලු ඇති චීවර (අච්ඡින්නදසානි චීවරානි)
2. දික් දාවලු ඇති චීවර (දීඝදසානි චීවරානි)

3. මල් දාවලු ඇති චීවර (පුප්ඵදසානි චීවරානි)
4. පෙණ දාවලු ඇති චීවර (ඵණදසානි චීවරානි)

මෙහිදී හිස් වෙළුම් (වෙඨනං), සැට්ට (කඤ්චුකං), ගස්වල පොතුවලින් කළ පිළි (තිරීටකං) ආදිය ද නුසුදුසුයැයි පැවසේ. ගිහියන් පරිභෝග කරන කමිස බැනියම් ආදී ඇඳුමක් වශයෙන් ඇඟලන ඒවා කඤ්චුක නමින් හැඳින්වේ. හිස්වෙළුම් හා සැට්ට පිරිකර වශයෙන් දායකයන්ගෙන් ලැබුනොත් ඒවා පලා පඩුපොවා සිවුරු මෙන් සකස කරගැනීමටත් තිරීටක හෙවත් සුඹුළු වස්ත්‍ර පාපිස්නක් කොට දැරීමටත් සුදුසු බව සමන්තපාසාදිකාවේ කියැවේ. උක්ත වර්ණය අනුව වර්ග කළ නුසුදුසුයැයි අනුදත් සිවුරු වර්ග හතත්, මෑසූ ක්‍රමය අනුව නොඅනුදත් සිවුරු හතරත් යන එකොළොස 'එකොළොස් අකප්පිය චීවර' ලෙස ඇතැම් ග්‍රන්ථයන්හි හඳුන්වා දෙයි. සොරුන් විසින් සිවුරු පැහැරගත් භික්ෂුවකට පමණක් මේ අකැපයැයි දක්වූ සිවුරු චෝරභය අවසන් වනතෙක් දැරිය හැකි බව සමන්තපාසාදිකාවේ අඤ්ඤාතක විඤ්ඤත්ති සිකපද වර්ණනාවේ පැවසේ.

## ආශ්‍රිත ග්‍රන්ථ


මහාවග්ග පාළි' - 2 භාගය - බු.ජ.ත්‍රි.

බෞද්ධ ශබ්දකෝෂය'-සිරි ලියනගේ-1 භාගය. ඉඳුරුː ඔෆ්සෙට් ප්‍රින්ටර්ස්

චන්දවිමල හිමි, රේරුකානේ (1970). *උපසම්පදා ශීලය.* අනුර මුද්‍රණාලය.

මනෝරථපූරණී-2 භාගය. (1931). හේවාවිතාරණ.

පාරාජික පාළි. බු.ජ.ත්‍රි.-

සුමංගලවිලාසිනී-1 භාගය. (1918). හේවාවිතාරණ මුද්‍රණ

චන්දවිමල හිමි, රේරුකානේ. (1992). ශාසනාවතරණය. බොරලැස්ගමුවː ප්‍රබුද්ධ ප්‍රකාශන.